# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## බාහිර විභාග අංශය

### ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ද්විතීය පරීක්ෂණය (බාහිර) - 2009

### (2010 මැයි / ජූනි)

### මානවශාස්ත්‍ර පීඨය

### ප්‍රතිබිම්බ කලා - IMAT –E2025

### ලෝක සිනමාව පිළිබඳ ගවේෂණය

<u>ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න</u>

ප්‍රශ්න සංඛ්‍යාව : 09 යි                                        කාලය : පැය 03 යි

---

01. චිත්‍රපට මාධ්‍යය කලාවක් ලෙස වර්ධනය කිරීමට ඩී.ඩබ්ලිව්. ග්‍රිෆිත්ගෙන් සිදු වූ මෙහෙය පරීක්ෂා කරන්න.

02. නිහඬ යුගයේ සෝවියට් සිනමාව, හොලිවුඩ් සිනමාවට වඩා වෙනස් ස්වරූපයක් ගත්තේ කෙසේද යන්න පැහැදිලි කරන්න.

03. චාලි චැප්ලින්ගේ හාස්‍යජනක (comedy) චිත්‍රපටවල විශේෂත්වය පිළිබඳ විමසීමක් කරන්න.

04. සර්ජි අයිසන්ස්ටයින්, පුඩොව්කින්, කුලෂොව් යන සිනමාකරුවන්ගේ අත්හදාබැලීම්, පර්යේෂණ හා නිර්මාණ ලෝක සිනමාවේ වර්ධනයට බලපෑ ආකාරය විමසන්න.

05. ජර්මන් ප්‍රකාශනවාදී සිනමාව බිහිවීමට හේතු වූ පසුබිම විස්තර කොට එම ප්‍රවණතාවයේ මූලික ලක්ෂණ පෙන්වා දෙන්න.

06. ඉතාලියානු නවතාත්ත්වික සිනමාවේ පුරෝගාමී සිනමාකරුවන් හා ඔවුන්ගේ නිර්මාණ පිළිබඳ විමර්ශනයක් කරන්න.

07. ප්‍රංශ නවරැල්ලේ පුරෝගාමී සිනමාකරුවකුගේ නිර්මාණ පිළිබඳ විග්‍රහයක් කරන්න.

08. වාර්තා සිනමාවේ ප්‍රභවයට හා ප්‍රගතියට රොබට් ෆ්ලැහර්ටි හා ජෝන් ග්‍රියර්සන් ගෙන් ඉටු වූ මෙහෙය පරීක්ෂා කරන්න.

09. කෙටි සටහන් ලියන්න.

    අ). කෙටි චිත්‍රපට

    ආ). කලාත්මක චිත්‍රපට

    ඇ). විද්‍යා ප්‍රබන්ධ චිත්‍රපට

    ඈ). ප්‍රවෘත්ති චිත්‍රපට (News Reel)

*******************